ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2026

අ.පො.ස.(සා.පෙළ) - 2026 විභාගය, 2026 දෙසැම්බර් මස 08 වන දින ආරම්භ කර 2026 දෙසැම්බර් මස 17 වන දින දක්වා පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම විභාගය සඳහා පෙනී සිටින පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර අදාළ පාසලේ විදුහල්පතිවරුන් වෙත යවා ඇති අතර, සියලුම පාසල් අයදුම්කරුවන් තම විභාග ප්‍රවේශපත්‍රය විදුහල්පති වෙතින් ලබා ගත යුතුයි. පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර ඔවුන්ගේ පෞද්ගලික ලිපිනයට තැපැල් මඟින් යොමු කර ඇත.

තැපැල් මඟින් මේ වන තෙක් ප්‍රවේශ පත්‍ර නොලැබුණු පෞද්ගලික අයදුම්කරුවන් හට **2026.11.23** වන දින සිට www.doenets.lk යන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියට පිවිස තම ප්‍රවේශ පත්‍රය බාගත කර ගත හැකිය.

ප්‍රවේශ පත්‍ර නොලැබුණු හෝ ප්‍රවේශ පත්‍ර බාගත කරගත නොහැකිවූ පෞද්ගලික අයදුම්කරුවන් වෙතොත් තමා ඉදිරිපත් කළ ඉල්ලුම්පතේ පිටපතක්, විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් හෝ විභාග ගාස්තු ගෙවූ බවට තැපැල් ස්ථානාධිපතිගෙන් ලබා ගත් සහතික කළ ලිපියක් සමග විභාග දෙපාර්තමේන්තුවට පැමිණිය යුතු ය.

ප්‍රවේශ පත්‍ර සංශෝධනය කිරීම

පාසල් අයදුම්කරුවන් සහ පෞද්ගලික අයදුම්කරුවන් වෙත ලැබී ඇති **ප්‍රවේශ පත්‍රයන් හි විෂයය, මාධ්‍යය හා නාම සංශෝධන සිදු කර ගැනීමට ඇත්නම්,**

- **පාසල් අයදුම්කරුවන් විදුහල්පති මඟින් ද, පෞද්ගලික අයදුම්කරුවන් තමන් විසින් ද, සියලු ම සංශෝධන මාර්ගගතව සිදු කර ගත යුතු අතර ඒ සඳහා** https://onlineexams.gov.lk **වෙබ් අඩවිය වෙත පිවිසිය යුතු ය.**
- **එක් අයදුම්කරුවකුට මෙම සංශෝධන සිදු කර ගැනීමට ලැබෙනුයේ එක් අවස්ථාවක් පමණි.**
- **මෙම විභාගයේ විභාග මධ්‍යස්ථාන මාරු කිරීම් සිදු කරනු නොලැබේ.**
- **සංශෝධන සිදු කිරීම 2026.11.19 වන දින ආරම්භ කර 2026.11.30 දින මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් වේ.**

සැ.යු. අයදුම්කරුගේ විභාග ප්‍රවේශ පත්‍රයෙහි ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත නමෙහි වෙනසක් තිබේ නම් විභාගයට පෙර මෙම ලබා දී ඇති කාලසීමාව තුළ මාර්ගගතව එම සංශෝධන සිදු කිරීම අනිවාර්යය වන අතර කිසිදු හේතුවක් මත විභාගයෙන් පසුව නාම සංශෝධන සිදු කරනු නොලැබේ.

අයදුම්කරුවන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ මෙම විභාගය සඳහා පිළිගත් හැඳුනුම්පතක් වශයෙන් පිළිගනු ලැබේ.

1. අයදුම්කරුවෙකු වෙනුවෙන් වෙනත් අයෙකු විභාගයට පෙනී සිටීම, සටහන් ළඟ තබාගෙන පිළිතුරු සැපයීම, වෙනත් අයදුම්කරුවෙකුගේ උදව් ලබාගැනීම, උදව් දීම හා විභාග ශාලාවේ හා ඒ අවට නොමනා හැසිරීම විභාග පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
2. මෙම විභාගය සඳහා ගණකයන්ත්‍ර හා මකන දියර පාවිච්චි කිරීමට ඉඩදෙනු නොලැබේ.
3. දැනටත් කිසියම් රජයේ පාසලක ඉගෙනුම් ලබන අයකු පෞද්ගලික අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.
4. විභාග ශාලාව තුළට ජංගම දුරකථන, ස්මාට් වොච් හෝ ඉලෙක්ට්‍රොනික උපාංග ගෙන ඒම සන්තකයේ තබා ගැනීම හා භාවිතය සපුරා තහනම් වේ. මෙම නියමය කඩ කරන අය වසර පහක විභාග තහනමකට ලක් විය හැකි අතර අදාළ උපාංග රාජසන්තක වීමට ද ඉඩ ඇත.
5. විභාග අපේක්ෂකයන් බ්ලූටූත් (Bluetooth) වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ/උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී **විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ තම මුහුණ සහ කන්දෙක විවෘතව පැහැදිලිව පෙනෙන සේ තබා ගත යුතුය.** එම විභාග නීති උල්ලංඝනය කරනු ලබන අපේක්ෂකයින් සඳහා නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ.

විමසීම් :-
දුරකථන අංක : 011-2784537, 011-2784208, 011-2786616
ෆැක්ස් අංකය : 011-2784422
ක්ෂණික ඇමතුම් : 1911
විද්‍යුත් ලිපිනය : gceolexamsl@gmail.com
තැපැල් ලිපිනය : විභාග කොමසාරිස්, පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල.

6/4/OL/2026
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2026.11. ١٩ දින

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

D:\OL EXAM\2026\OL paper add for Admission 2025.docx